මැඬියෙක් පනියි
ජලයෙන් හඬක් නැගිණා"

මෙවන් රචනා තුළ ගැබ් වූ පුළුල් අරුත සමග සෞන්දර්යයක්, චමත්කාරයක් විඳගැනීමට ජපන් සහෘදයා නිතැතින්ම සමත් වනු ඇත. 'මත්සුඔ බෂෝ' කවියා, දස වසරකට පසු තම උපන් ගමට ගිය අවස්ථාවේදී, තම මිය ගිය මෑණියන්ගේ හිස කෙස් රොදක් අත මිට මොළවාගෙන සිටි අවස්ථාවක් ගැන ඔහු රචනා කළ තවත් හයිකු කවියකි, මේ.

"අතට ගත් කෙස් රොද
සරත් සමයේ හිම මෙන්
උණු කඳුළින් දියව යයි"

කෙටි කවි වේවා, 'සැකෙවි කවි' වේවා, නිසඳැස් හෝ සඳැස් කවි හෝ වේවා නූතන ශ්‍රී ලාංකික තරුණ පරපුර තම හැඟීම් පළ කිරීම සඳහා ඉදිරිපත් කරන නිර්මාණ සැබවින්ම සමාජ පිළිබිඹුවක් ලෙස ද සැලකිය හැකිය. මෑතක දී සිය දෙවන කාව්‍ය නිර්මාණය එළි දැක්වූ, කැලණිය විශ්වවිද්‍යාලයේ දිනීෂා ලියනගේ තරුණ කිවිඳිය එමගින් සමාජයට ගෙන එන පණිවුඩ රාශියකි. දිනීෂා ලියනගේ තම නිර්මාණ මගින් පළ කරනුයේ සිය අවට සමාජය නිරීක්ෂණය කරද්දී කිවිඳියක ලෙස ඇය ලද අත්දැකීම්ය. ඇය සතු කාව්‍ය කුසලතා එළි දක්වමින් රචනා කර ඇති නිර්මාණ හතළිහකින් සමන්විත මෙම කාව්‍ය සංග්‍රහය ඇය නම් කර ඇත්තේ 'ගිනි' නමිනි. සංස්කෘතික ගැටලුවලට මුහුණ දෙමින් ද ආර්ථික ප්‍රශ්නවලින් බැටකමින් ද, නූතන තරුණ පෙළ ගෙවන අසහනකාරී ජීවිතය මෙම කිවිඳියගේ කවි ඇසට විෂය වී ඇති ආකාරය වැදගත්ය.

දිනීෂා සිය කාව්‍ය සංග්‍රහයේ ආරම්භයට 'නූපන් බිළිඳු' නමින් රචිත කවි පෙළක් යොදාගන්නා අතර කෘතියේ අවසාන නිර්මාණය වී ඇත්තේ 'මරණය' නම් කෙටි කවයි. අහම්බ සිදු වීමක් ලෙස හෝ ඇයගේ කාව්‍ය සංග්‍රහය උපත ගැන කියමින් අරඹා 'මරණය' ගැන කියමින් අවසන් වී තිබීම කිසියම් විශේෂත්වයකි.

"ජීවිතය තැළ
ලබන
අතිශය නිහඬ
ජයග්‍රහණයි"
(ගිනි, දිනීෂා ලියනගේ, 90 පිට)

මෙලෙසින් මරණය හඳුන්වන කතුවරිය ඊට පෙර ඉදිරිපත් කර ඇති කාව්‍ය රචනා තිස් නවයෙන් ගෙන ආ සමාජ විෂමතා, තරුණ පෙළ අත්විඳින මානසික අසහනය, සමාජ ගැටලු යනාදියෙහි කෙළවර අතිශය නිහඬ, ජයග්‍රහණයක් වන මරණය ලෙස, කාහටත් පොදු ධර්මතාවක් වන අනිත්‍යය සම්බන්ධ කරමින් ඉදිරිපත් කර ඇත.

'නූපන් බිළිඳු' මගින් දිනීෂා සැබෑ සමාජ ගැටලුවක් දෙස සංවේදී ඇසකින් බලා නිර්මාණය කර ඇති කාව්‍ය රචනයක් ඉස්මතු වී පෙනෙයි.

"නූපන් බිළිඳුන් කුස තුළ
මැරුවා යයි කියනාවුන්
ඇඟිල්ල දික් කරලා මට
'පව්කාරිය' යයි කීවා

පුතේ නුඹේ මේ අම්මා
මහ ලොකුවට හිතට අරන්
ආදරයක් කළා ජයට ....
අවසානේ"
(ගිනි, 13 පිට)

ශ්‍රී ලංකාව තුළ පමණක් නොව ලෝකයේ කවර රටක වුව කාන්තාව අත්දකින බේදනීය අත්දැකීම් සමුදායක් සමග මනා සමාජ පිළිබිඹුවක් මෙම රචනාව තුළ දක්නට ඇත. දිනීෂාගේ කාව්‍ය නිර්මාණවලට, විෂය වී ඇති කරුණු හාත්පස සමාජය සිසාරා බලා ඇය දුටු දේය. ස්වීය අත්දැකීම්ම නොවුවද වර්තමාන සමාජය තුළ විශේෂයෙන්ම තරුණ පෙළ මුහුණදෙන ශෝචනීය අත්දැකීම් රැසක් මෙම කවි මගින් චිත්‍රණය වී ඇත. දිනීෂා සිතන පරිදි කවිය මගින් සමාජයට පණිවුඩයක්, ප්‍රබල සන්නිවේදනයක් කළ හැකි බවට 'ගිනි' කාව්‍ය සංග්‍රහයේ බොහෝ රචනා දෙස් දෙයි.

> Life isn't about finding yourself. Life is about creating yourself.
> George Bernard Shaw




